# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.06.07 පැය 0940 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1161/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**2025 වර්ෂයේ පැවැත්වෙන පොසොන් උත්සවයට සමගාමීව අනුරාධපුර පූජා නගරය මූලික කරගෙන ක්‍රියාත්මක ආරක්ෂක වැඩපිළිවෙල හා රථවාහන සැලැස්ම - පොලිස් මූලස්ථානය.**

2025 ජූනි මස 10 වන දිනට යෙදී ඇති පොසොන් පුන් පොහොය දිනය මූලික කරගෙන දිවයින පුරා බෞද්ධ බැතිමතුන් විසින් සිදු කරනු ලබන ආගමික වැඩසටහන් සම්බන්ධයෙන් ආරක්ෂාව ලබාදීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය විසින් ආරක්ෂක සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු සූදානම් කර ඇත.

පොසොන් උත්සවය සඳහා බැතිමතුන් වැඩි පිරිසක් පැමිණෙතැයි අපේක්ෂා කරනු ලබන අනුරාධපුර පූජා නගරය කේන්ද්‍ර කරගනිමින් විශේෂ ආරක්ෂක හා රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට නියමිතය. මේ සඳහා අනුරාධපුර මූලික කරගෙන මහජනතාවගේ ආරක්ෂාව සඳහා කලාප 06 වශයෙන් පොලිස් නිලධාරීන් 3500 කට ආසන්න සංඛ්‍යාවක් රාජකාරි සඳහා යොදවා ඇති අතර පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් හා යුධ හමුදා නිලධාරීන් අවශ්‍ය අවස්ථාවලදී සහය ලබාගැනීමට පොරොත්තු සේවා රාජකාරියේ යොදවා ඇත.

පොසොන් උත්සව සමයේදී, බොහෝ දෙනෙකුගේ වැඩි අවධානය යොමුවන්නේ ඓතිහාසික අනුරාධපුර නගරය වෙත වන අතර මිහින්තලා පූජා භූමිය, ශ්‍රී මහා බෝධිය ඇතුළු අටමස්ථාන ප්‍රදේශය, තන්තිරිමලය රජමහා විහාරය, අවුකන, විජිතපුර හා නාමල් උයන යන ප්‍රදේශ පිළිබඳව විශේෂ අවධානය යොමු කර ඇත.

අනුරාධපුර නගරයේ පහත සඳහන් ස්ථානවල රථගාල් ස්ථාපිත වන අතර ඒවායෙහි රථවාහන නතර කරන ලෙස පොලිසිය රියදුරන්ගෙන් ඉල්ලා සිටී.

01. රුවන්වැලි සෑය රථ ගාල
02. රුවන්වැලි සෑය ප්‍රභූ රථ ගාල
03. මිරිසවැටිය රථ ගාල
04. වට වන්දනා රථ ගාල
05. ඉසුරුමුණිය පාසල් රථ ගාල
06. ථූපාරාම සුසාන භූමිය අසල රථ ගාල
07. සඳහිරු සෑය රථ ගාල
08. පැරණි භික්ෂු විද්‍යාල රථ ගාල
09. අභයගිරිය රථ ගාල
10. ලංකාරාම රථ ගාල
11. සමාධි පිළිම රථ ගාල
12. ජේතවනාරාම රථ ගාල
13. නෙල්ලිකුලම පාසල් රථ ගාල
14. පුරාවිද්‍යා හන්දිය රථ ගාල
15. පැරණි බන්ධනාගාර රථ ගාල
16. කුරුණෑගල හන්දිය රථ ගාල
17. අක්කර 08 රථ ගාල
18. පැරණි පොලිස් භූමි රථ ගාල
19. පැරණි පොලිස් භූමි ප්‍රභූ රථ ගාල

20. සඳකඩ පහණ රථ ගාල
21. කුට්ටම් පොකුණ රථ ගාල

❖ **<u>මිහින්තලය පූජා භූමිය තුල රථ ගාල් 07 ක් පහත සඳහන් ස්ථානවල ස්ථාපිත කර ඇත.</u>**

01. අඹකොටුව රථ ගාල
02. කඳු පාමුල රථ ගාල
03. කළුදිය පොකුණ රථ ගාල
04. ඉසුරු උයන රථ ගාල
05. තිස්ස ක්‍රිඩාංගන රථ ගාල
06. නව රථ ගාල
07. ප්‍රාදේශීය ලේකම් කායර්ාල නිල නිවාස රථ ගාල

අනුරාධපුර නගරය ආශ්‍රිතව ඇති වැව් සහ ජලාශවල දිය නාන පිරිසගේ ආරක්ෂාව සඳහා පොලිස් ජීවිතාරක්ෂක නිලධාරීන් 150 කට ආසන්න සංඛ්‍යාවක් අනුරාධපුර ප්‍රදේශයේ රාජකාරි යෙදවෙන අතර 3500 කට වැඩි පොලිස් නිලධාරීන් සංඛ්‍යාවක් අනුරාධපුර පූජා භූමිය මූලික කරගෙන පොසොන් උත්සවයේ ආරක්ෂක රාජකාරි යොදවා මහජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගෙන ඇත.

පූජා භූමියට මත්පැන් සහ මත්ද්‍රව්‍ය රැගෙන ඒමෙන් වලකින ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටින අතර මාගර්යේ නුසුදුසු ස්ථානවල රථවාහන නැවතීම හෝ නවතා තැබීම රථවාහන තදබදයක් ඇතිවීමට හේතුවන බැවින් ඒවා නියමිත රථගාල් වල පමණක් නැවතීම කළ යුතුය. රථවාහන වල ආරක්ෂාව සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක වන පරිදි පොලිස් නිලධාරීන් රාජකාරී යොදවා ඇත. යම් හදිසි අවස්ථාවකදී ඇමතීම සඳහා අංක 025 - 2222124 දරණ පොලිස් මෙහෙයුම් මැදිරියේ දුරකථන අංකය භාවිතා කල හැකි අතර අනුරාධපුර ප්‍රදේශයට අදාලව රථවාහන තදබදයකදී හෝ රථවාහන ආපදා තත්ත්වයකදී අංක 071 - 8593330 දරන දුරකථන අංකයට ඇමතීම් කර පොලිස් නිලධාරීන්ගේ සහයෝගය ලබා ගැනීමට හැකියාව ඇත.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය